**තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**----------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 ජුනි 29 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**------------------------**

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**---------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර තැන්පතු සඳහා වන සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු. 206,640 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.3,896,375 ක් වශයෙන් දක්නට ලැබුණත් 2016 ජනවාරි 01 දිනට මෙම ශේෂය රු.3,644,985 ක් වශයෙන් ඉදිරියට ගෙන ඒම නිසා සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල මෙම ණය ශේෂය රු.251,390 කින් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගනු ලැබූ රු.92,065 ක් වටිනා ලී බඩු පුනරාවර්තන වියදමක් ලෙස දක්වා තිබුණි.

(ඈ) ලෙජරය අනුව 2016 දෙසැම්බර් 31 දිනට පැවැති ප්‍රතිපූර්ණය කළ හැකි විවිධ තැන්පතු ශේෂය රු.2,085,980 ක් ලෙස දක්නට ලැබුණත්, මූල්‍ය ප්‍රකාශනයේ මෙම ශේෂය රු.2,206,904 ක් ලෙස දක්නට වූයෙන් ප්‍රතිපූර්ණය කළ හැකි විවිධ තැන්පතු රු.120,924 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.3 ලැබිය යුතු මුදල්**

2016 දෙසැම්බර් 31 දිනට පැවැති හිඟහිටි රජයේ ප්‍රදාන රු.2,412,119 කින් රු.854,868 ක් වර්ෂ 12 කට අධික කාලයක සිට හිඟහිටව තිබුණත්, ඒවා අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ගොඩනැගිලි | 126,013,965 | ස්ථාවර වත්කම් ලේඛනය |
| පිරියත හා යන්ත්‍ර | 2,425,198 | |
| ලී බඩු හා සවිකිරීම් | 1,468,599 | |

**1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 371 | යම් කාර්යයන් සඳහා අත්තිකාරම් ලබාදුන්නේද එම කාර්යය ඉටු වූ වහාම අත්තිකාරම් මුදල් නිරවුල් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ රු.284,800 ක් වටිනා අත්තිකාරම් 12 ක් දින 30 ක සිට දින 360 ක් දක්වා වූ කාල පරාසයකින් පසුව නිරවුල් කර තිබූ අතර, සභාවේ සභාපතිවරයා, කොන්ත්‍රාත්කරුවන් සහ තාක්ෂණික නිලධාරීන් ආදී අයට ලබාදෙනු ලැබූ රු.1,447,820 ක අත්තිකාරම් 4 ක් වර්ෂ 04 කට අධික කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 සිට 9 දක්වා වූ කාලයක් කල් ඉකුත්ව ආපසු ගෙවිය යුතු රු.6,095,873 ක් වටිනා තැන්පතු 246 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | IAI/2002/02 අංක දරන 2002 නොවැම්බර් 28 වන දින භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක 06 ක් පරිගණක උපාංග සහ පරිගණක මෘදුකාංග ලේඛනගත කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,800,750 ක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,810,562 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.990,188 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 වරිපනම් හා බදු

--------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ව්‍යාපාරික ස්ථාන 439 ක් සහ නිවාස 8,972 ක් මත වරිපනම් තක්සේරු කර අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.4,700,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

#### 2.2.2 මස් කඩ, මාළු වෙළඳපොල සහ මහජන වෙළඳපොල බදු අයකිරීම

------------------------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට පැවැති මස් කඩ, මාළු වෙළඳපොල සහ මහජන වෙළඳපොල හිඟ බදු කුලී රු.1,026,715 කින් රු.769,335 ක හිඟ බදු කුලී වර්ෂ 02 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

#### 2.2.3 කුලී ආදායම්

---------------

2016 දෙසැම්බර් 31 දිනට පැවැති හිඟ හිටව පැවැති කුලී ආදායම් රු.1,360,227 කින් වටිනාකම රු.734,585 ක හිඟ කුලී වර්ෂ දෙකකට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

#### 2.2.4 දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම

----------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව සභාව විසින් ආදායම් අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීම ප්‍රමාද වීම නිසා සභා බල ප්‍රදේශයේ පුද්ගලික ආයතන විසින් තමන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිත කර තිබූ දැන්වීම් පුවරු 14 ක් සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් වාර්ෂිකව රු.60,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වාහන 7 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට සභාව විසින් භාවිතා කරමින් පැවතුණ ද, ඒවා සභාවේ නමට මාරුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයේ පැවැති සභාවට අයත් ට්‍රැක්ටර් 03 ක්, ගල් රෝල 03 ක් සහ බවුසරයක් ආදිය වර්ෂ 03 කට අධික කාලයක සිට අලුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් ඒවා භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**3.2.1 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත සඳහන් වැඩසටහන යටතේ එක් වීදියක් පිළිසකර කිරීමේ කටයුත්ත රු.441,915 ක වියදමින් සම්පූර්ණයෙන් සිදුකළ බවට ලියකියවිලි සකස් කොට තාක්ෂණ නිලධාරීයාගේ නිර්දේශ ලබාගැනීමෙන් 2016 දෙසැම්බර් 31 දින ඒ සඳහා මුදල් ලබාගෙන තිබූ නමුත්, අදාළ කටයුත්ත මේ දක්වා සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) මෙම වැඩසටහන යටතේ ප්‍රධාන බස් නැවතුම්පොළ ඉදිකිරීමේ කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා නොගෙන රු.167,000 ක ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කර රු.76,165 ක් වැය කිරීමෙන් අනතුරුව මෙම ඉදිකිරීම මාර්ග සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය තුළ සිදුකිරීම හේතුවෙන් මෙම කටයුත්ත අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන් මේ සඳහා දරනු ලැබූ වියදම නිෂ්ඵල වියදමක් බවට පත් වී තිබුණි.

**4. පද්ධති හා පාලන**

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | අවධානය යොමු කළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගැනීම. |
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |